# තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - 14 ඒකකය ව්‍යාපෘතිය

1.ලක්ෂණ අනුව පද්ධති වර්ගීකරණය නිවැරදිව ප්‍රකාශ වන පිළිතුර කුමක්ද?

1.ස්වභාවික හා කෘතිම පද්ධති
2.ස්වභාවික හා ආවෘත පද්ධති
3.තාවකාලික හා ස්ථිර පද්ධති
4.විවෘත හා ආවෘත පද්ධති
5.තොරතුරු පද්ධති හා දත්ත පද්ධති

2.පද්ධතියක කාර්යබද්ධ නොවන අවශ්‍යතා සඳහා වඩාත් ගැළපෙන ප්‍රකාශය තෝරන්න.

1.වැටුප් සකසන තොරතුරු පද්ධතියක සේවක පැමිණීම ඇතුළත් කිරීමට හැකියාව ලබා දීම.
2.තොග පාලන මෘදුකාංග පද්ධතියක කළමනාකරුට ඉතිරි තොග ප්‍රමාණයන් බලා ගැනීමට හැකියාව පැවතීම.
3.භාවිතා කරන පද්ධතියෙන් වාර්තා ලබා ගැනීමට හැකියාව අඩංගු කර පැවතීම.
4.පද්ධතිය ඉතා සරලව භාවිතා කිරීමට හැකි ලෙස තිර (GUI) සකසා තිබීම.
5.වැටුප් තොරතුරු පද්ධතියක සේවකයාට ලබා දීමට වැටුප් ලේඛන මුද්‍රණය කිරීමේ හැකියාව.

3.පද්ධති සංවර්ධන ජීවන චක්‍රයේ (SDLC) ගැටළුව හඳුනාගැනීමට (Problem Identification) අදාළ පියවරේ සිදු කරනු ලබන කාර්යයන්වලට අයත් වන ප්‍රකාශය තෝරන්න.

1.මූලික විමර්ශනය සහ ශක්‍යතා අධ්‍යයනය
2.කාර්යබද්ධ නොවන අවශ්‍යතා හඳුනා ගැනීම.
3.සම්මුඛ සාකච්ඡා පැවැත්වීම,සෘජු නිරීක්ෂණය,පවත්නා පොත් පරීක්ෂා කිරීම,මූලාකෘති සැකසීම.
4.මූලාකෘති සැකසීම.
5.මෘදුකාංගයට අදාළ කාර්යබද්ධ අවශ්‍යතා හඳුනා ගැනීම.

4.පද්ධති සැලසුම් අවස්ථාවේ සිදු නොකරන කාර්යය තෝරන්න.

1.ගැලීම් සටහන් සැකසීම.
2.ව්‍යාජ කේත සැකසීම.
3.අතුරු මුහුණත් සැකසීම.
4.සකස් කරන ලද ඒකක පරීක්ෂා කිරීම.
5.වස්තු සම්බන්ධක ආකෘති සැකසීම.

5.පරිගණක භාෂාවක් අවශ්‍ය වන්නේ පද්ධති සංවර්ධන ජීවන චක්‍රයේ කුමන පියවරේදීද?

1.පද්ධති විශ්ලේෂණ අවස්ථාවේදී
2.පද්ධති සංවර්ධනය කරන අවස්ථාවේදී
3.ස්ථාපිත කරන අවස්ථාවේදී
4.පද්ධති පරීක්ෂා කරන අවස්ථාවේදී
5.ගැටළුව හඳුනා ගැනීමේදී

6.සකස් කරන ලද මෘදුකාංග පද්ධතියක් සැබෑ දත්ත භාවිත කරමින් පරිශීලක පරිසරයක් තුළදී කරනු ලබන පරීක්ෂාව හඳුන්වනු ලබන නම කුමක්ද?

1.බීටා පරීක්ෂාව
2.ශ්වේත මංජුසා පරීක්ෂාව
3.පද්ධති පරීක්ෂාව
4.ඇල්ෆා පරීක්ෂාව
5.ඒකක පරීක්ෂාව

7.පරිගණක ආශ්‍රිත නිර්මාණකරණය තුළින් බිහිවන නිර්මාණ ගබඩා කිරීම සඳහා වඩාත් සුදුසු දත්ත ගොනු වර්ගය වන්නේ,

1.සම්බන්ධක දත්ත ගොනු
2.පැතලි දත්ත ගොනු
3.ධූරාවලි ආකෘතිය
4.ජාල ආකෘතිය
5.වස්තු සම්බන්ධක ආකෘති

8.දත්ත ගොනුවකට අදාළ තාර්කික සැකැස්ම රූපමය ආකාරයෙන් නිරූපණය කිරීමට යොදාගනු ලබන ආකෘති වර්ගය වන්නේ,

1.දත්ත ගොනු ආකෘති
2.කාර්යය රූපසටහන්
3.වස්තු සම්බන්ධක ආකෘතිය
4.දත්ත ගැලීම් සටහන
5.ජාල දත්ත ගොනු ආකෘතිය

9.ඇල්ගොරිතමයක් ගොඩනැගීමට යොදාගනු ලබන නිවැරදි ක්‍රමවේදය වන්නේ,

1.දත්ත ගැලීම් සටහන් පමණක් භාවිතය
2.පරිගණක භාෂාවේ කේතයන් යොදා ගැනීම.
3.වරණ පාලනයන්,පුනර්කරණයන් යොදා ගැනීම.
4.ව්‍යාජ කේත පමණක් යොදා ගැනීම.
5.ව්‍යාජ කේත සහ ගැලීම් සටහන් භාවිත කිරීම.

10.පරිගණක භාෂාවන්හි පරිණාමය නිවැරදිව පෙන්වා ඇති ප්‍රකාශය කුමක්ද?
1.යන්ත්‍ර භාෂාව/ඇසෙම්බ්ලි භාෂාව/උසස් මට්ටමේ පරිගණක භාෂා
2.පහළ මට්ටමේ පරිගණක භාෂා/උසස් මට්ටමේ පරිගණක භාෂා
3.යන්ත්‍ර භාෂාව/උසස් මට්ටමේ පරිගණක භාෂා/ඇසෙම්බ්ලි භාෂාව
4.උසස් මට්ටමේ පරිගණක භාෂා/ඇසෙම්බ්ලි භාෂාව/යන්ත්‍ර භාෂාව
5.ඇසෙම්බ්ලි භාෂාව/යන්ත්‍ර භාෂාව/උසස් මට්ටමේ පරිගණක භාෂා

**<u>පිළිතුරු</u>**

| | |
|---|---|
| 1.) 4 | 6.)1 |
| 2.) 4 | 7.) 5 |
| 3.) 1 | 8.)3 |
| 4.) 4 | 9.)5 |
| 5.) 3 | 10.)1 |

සකස් කළේ,
එච්.ඒ.එන්.නිමාලි මිය,
ර/කරඳන ජිනරතන ම.වි.